


විදුදය
භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2026, 05 (01): 01-18

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

# උග්ගල් අලුත්නුවර කුඩා කතරගම දේවාලයේ ඉල්මහ කාර්තික මංගල්‍යයෙන් නිරූපිත ප්‍රාදේශීය සංස්කෘතික ලක්ෂණ (රුහුණු මහා කතරගම දේවාලයේ ඉල්මහ කාර්තික මංගල්‍යය හා සංසන්දනාත්මක අධ්‍යයනයක්)

*ආර්. එම්. පී. එස්. වීරසූරිය, ඩබ්ලිව්. වී. පී. එච්. රණවීර[2]

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය[1] භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය[2]
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

prasad.weerasooriya1@gmail.com[1], himalika@sjp.ac.lk[2]

## Abstract

This study compares the Kārtika festival at the Kuḍā Kataragama Dēvālaya with that of the Ruhuṇu Mahā Kataragama Dēvālaya, Sri Lanka's principal shrine dedicated to God Kataragama, to examine whether the Aluthnuwara Dēvālayē exhibits distinctive regional characteristics in its rituals and offerings. This ethnographic study adopts a subjectivist methodological approach, employing interpretivism and grounded in inductive reasoning. To obtain preliminary data relevant to both sites, written sources were consulted, and as a historical investigation, the basic cultural context was explored. Comparative data were collected through direct observations and interviews during the Kārtika festivals over the past two consecutive years. Ancestral priests *(kapu mahatā)*, women involved in the rituals (*ālatti ammāvaru)* and *Diggē* dancers were selected as data contributors using purposive and snowball sampling methods. While this festival at Kataragama is conducted with a blend of both Sinhala and Tamil cultural elements, the festival in Aluthnuwara displays certain cultural features that are distinctive to the Sabaragamuwa region. During five-day Uggal Alutnuvara Kuḍā Kataragama Dēvālaya festival, the sacred ornaments of the deity are ceremonially taken in procession around the Dēvālaya and then reinstalled. In Katharagama, the *Valli Ammā Dēvālaya* is associated with these rituals, whereas in Aluthnuwara, the *Pattini Dēvālaya* performs subsidiary rituals in connection with this ceremony. *Nil Pandama Ræɡena Ēma, , Baṇḍāravarun Hā Naiyiyanḍi Paṁguva Dakuṇu Ata Næṭīma, Diggē Næṭīma, Naiyiyanḍi Paṁguvē Kōlam Muhuṇu Næṭīma, Pahan Maḍuva* and *Kap Siṭuvīma* at Pattini Dēvālaya are several rituals represent distinctive regional identities unique to Uggal Aluthnuwara Dēvālaya. The study found that, despite common religious roots, each Dēvālaya's Kārtika festival expresses its unique regional culture.

**Key Words** - Uggal Aluth Nuwara, Cultural Identities, Kārtika Pūjā, Diggē dance, Pattini Dēvālaya .

## 1. හැඳින්වීම

උග්ගල් අලුත්නුවර කුඩා කතරගම දේවාලය රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති කතරගම දෙවියන් පුද ලබන ඓතිහාසික වටිනාකමක් සහිත ස්ථානයකි. ක්‍රි.ව. 1382 පමණ මහනුවර මැදගම සූරිය මහ රජු විසින් මෙම දෙවොල නිර්මාණය කර වූ බව ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයනයේ දී පැහැදිලි වේ (මද්දුමාගේ, 2019). මහනුවර සම්ප්‍රදායේ වාස්තු විද්‍යාත්මක හා ගෘහ නිර්මාණ ලක්ෂණ අන්තර්ගත කරමින් මෙම දෙවොල නිර්මාණය වී ඇති අතර එය හේවිසි මණ්ඩපය, දිග්ගෙය, සඳුන්කුඩම හා මාලිගාව යනුවෙන් කොටස් හතරකින් යුක්ත ය. මෙම දෙවොලෙහි රාජකාරි සිදු කරන කපු මණ්ඩලය කුඩා බෙත්මේ හා මහ බෙත්මේ වශයෙන් කොටස් ද්විත්වයකින් සමන්විත ය. දේවාලයේ විවිධ කාර්යයන් සිදු කිරීම සඳහා රාජකාරි 99ක් අතීතයේ සිට ඉඹුල්පේ, හටන්පොළ, නළුවෙල, මාමල්මග යන ගම් හතරේ ජනතාව වෙත පවරා ඇති අතර එයට පත්තිනි දේවාලයේ කපුනිලේ පංගු ද අන්තර්ගත වේ. එහි දී අලුත්නුවර ප්‍රදේශයෙන් ප්‍රවේණි පංගු 103ක් ද, එගොඩ වලේබඩ ප්‍රදේශයෙන් ප්‍රවේණි පංගු 16ක් ද, නළුවෙල ප්‍රදේශයෙන් ප්‍රවේණි පංගු 33ක් ද, උඩුවගම්පත්තුව පල්ලෙකන්ද ප්‍රදේශයෙන් ප්‍රවේණි පංගු 10ක් ද මෙම දේවාලයට අයත් වේ. උග්ගල් අලුත්නුවර කතරගම දේවාලය ක්‍රි.ව 1823 දී මැදගම සූරිය මහරජු ආරම්භ කරන ලද බව පැරණි ලිපි ලේඛනවල සඳහන් වේ (ඥානවිමල හිමි, 1946). අතීතයේ දී මෙම ප්‍රදේශය මැදගම නමින් නාමකරණය වී තිබේ. මැදගම සන්නසෙහි මේ පිළිබඳ ඓතිහාසික කතා පුවත් බොහොමයක් සඳහන් වන අතර එසේ ම යාපා නැමැති රජ කෙනෙකු මෙම දෙවොල ඉදිකර වූ බව සබරගමුවේ පැරණි ලියවිලි කෘතියේ පහත පරිදි අන්තර්ගත ය. ''යාපා රජු මෙම ස්ථානයේ චෛත්‍යය, විහාර ගෙය, බෝධිය ඇතුළු බෞද්ධාගමික පුද සිරිත්වලට අනුව චාරිත්‍ර කිරීමට හැකිවන පරිදි අවශ්‍ය ඉදිකිරීම් කර අංග සම්පූර්ණ පූජා භූමියක් ලෙස දියුණු කළේය. පත්තිනි, කාලි අම්මා සහ දැඩිමුණ්ඩ යන දේවාල ද එම භූමියේ ම ඉදිකර ඇත'' (ඥානවිමල හිමි, 1946). දේවාලයේ පැවැත්ම සඳහා පළමුවැනි රාජසිංහ රජතුමා ඉඩම් පූජා කළ බව ද වැඩි දුරටත් සඳහන් වේ.

ශ්‍රී ලංකාවේ මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටි රුහුණු මහා කතරගම දේවාලය හම්බන්තොට දිස්ත්‍රික්කයට හා මැණික් ගඟ නිම්නයට මායිම්ව ස්ථානගත වී පවතී. කජරගම, කදරගම, කාචරගාම, කදරගම යනුවෙන් විවිධ නාමකරණයන්ගෙන් හඳුන්වනු ලබන වර්තමාන කතරගම පූජා භූමිය ආගමික හා සංස්කෘතික වටිනාකමක් සහිත ලාංකේය ජනතාව අතර ඉතා ප්‍රසිද්ධ පුද බිමකි. මෙම භූමියට ගිනිකොණ දෙසින් මැණික් ගඟ ගලා බසින අතර උතුරෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ දකුණු මායිම දක්නට ලැබේ. (රණසිංහ, 2011). කඳ සුරිඳුන් හෙවත් කතරගම දෙවියන් පුද ලබන මෙම භූමිය බෞද්ධ හා හින්දු සංස්කෘති ද්විත්වයට ම අදාළ පුද පූජා විධි භාවිත වන සුවිශේෂ ආගමික ස්ථානයකි.

උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ පාලන බලය රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රදේශීය ලේකම්වරුන්ගේ සහ බස්නායක නිලමෙවරුන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන බස්නායක නිලමෙවරයෙකු යටතේ සිදුවන අතර දේවාලයේ අනෙක් පුද පූජා කටයුතු සිදු වන්නේ රාජකාරි මණ්ඩලයක් යටතේ ය. ඇතුළු කට්ටලය හා පිට කට්ටලය ලෙස උක්ත සඳහන් රාජකාරි මණ්ඩලය නාමකරණය වේ. දෙවොල කොටස් හතරකින් සමන්විත බව ඉහත සඳහන් කළ අතර හේවිසි මණ්ඩපයේ නිල රාජකාරිය හේවිසි වැයීම වන අතර දිග්ගෙය කොටසේ මාණික්ක පංගුවේ කාන්තාවෝ දිග්ගේ නැටීම සිදු කරති. එසේම සඳුන්කුඩමට ඇතුළුවන ප්‍රධාන දොර දකුණු පසින් බස්නායක නිලමේ

ද, වම්පසින් රාජකාරී පංගුවේ ප්‍රධානියා වන අත්තනායක මොහොට්ටාල නිල වශයෙන් රාජකාරි සිදු කෙරේ. ආලත්ති අම්මාවරුන්, මාණික්ක පංගුව, තාලම් වාදකයන්, දෙවියන් වෙනුවෙන් වියන අල්ලන පිරිස, හක් වාදකයන්, ගණිතයා, බෙරකරු ආදී රාජකාරි මණ්ඩලය අදාළ ස්ථාන මූලික ව නිල රාජකාරි සිදු කෙරේ. අද්‍යතනයේ දී ද මෙම නිල රාජකාරි පාරම්පරික සේවයක් ලෙස සිදු කිරීම විශේෂත්වයකි.

රුහුණු මහා කතරගම දේවාලයේ ද අතීතයේ සිට වර්තමානය තෙක් ම නිල රාජකාරි සිදු වන්නේ විධිමත් සැලැස්මක් සහ පුරාණ ක්‍රමවේදයක් අනුව ය. එනම් දේවාලය සම්බන්ධ සෑම කාර්යයක් සඳහා ම නිල කරනු ලැබූ කාර්ය මණ්ඩලයක් පාරම්පරිකව අතීතයේ සිට සාම්ප්‍රදායිකව වෙන්ව ඇත. මෙසේ වෙන් කර ඇත්තේ රාජ නියෝගයෙන් බව කතරගම දෙවියන් උදෙසා තේවාවන් සිදු කරන කාර්ය මණ්ඩලයේ විශ්වාසය යි. මේ පිළිබඳ කරුණු රැසක් අඩංගු ලේඛනයක් මහා දේවාලය සතුව ඇති අතර එය ශ්‍රී බුද්ධ වර්ෂ 1658 දී රන් තහඩුවක ලියන ලද්දකි. වර්තමානයේ කතරගම දේවාලය පවත්වාගෙන යාම රාජකාරි මණ්ඩපයේ 18 දෙනෙකු විසින් සිදු කරන අතර ඔවුන්ගේ කාර්ය භාරය වන්නේ මෙම දෙවොලෙහි පුද පූජාවන් සඳහා අවශ්‍ය සියලු කටයුතු සලසා දීමයි. උඟ්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ මෙන්ම රුහුණු මහා කතරගම දේවාලයේ පුද පූජා සහ සියලු චාරිත්‍ර සිදු වන්නේ ද පාරම්පරික සිරිත් විරිත් අනුව ය. මෙහි දෛනික තේවාව දිනකට තෙවතාවක් සිදු කරන අතර සෙනසුරාදා නානුමුර පූජාව සිදු කරන හෙයින් මෙදිනට පමණක් පූජාව පෙරවරුවේ සහ සවස පමණක් සිදු කෙරේ. රාජකාරි සිදු කිරීමේ දී ද මණ්ඩපයේ දහඅට දෙනාගේ රාජකාරි ස්ථාපිත රාජකාරි ලෙස පවරා ඇති අතර එකී රාජකාරි වර්තමානයේ ද ක්‍රියාත්මක වනු ලැබේ.

ලංකාවේ කතරගම දෙවියන් වෙනුවෙන් පුද පූජා සිදු කරන ප්‍රධාන දෙවොල වන රුහුණු මහා කතරගම දෙවොලෙහි මෙන් ම උඟ්ගල් අලුත් නුවර කුඩා කතරගම දේවාලයෙහි ද සිදු කෙරෙන වාර්ෂික උත්සව කිහිපයක් සිදු වුවත් පෙරහැර මංගල්‍යයන් මේ අතර සුවිශේෂ වේ. මෙම පෙරහැර මංගල්‍යයන් ලෙස අලුත් අවුරුදු මංගල්‍යය හා පෙරහැර, ඇසළ මංගල්‍යය හා පෙරහැර, කාර්තික මංගල්‍යය හා පෙරහැර හඳුනාගත හැකිය. මේ අතුරින් කාර්තික මංගල්‍යයත් ඊට සමගාමී ව සිදු කරන පෙරහැරත් විශේෂ වේ. කතරගම දෙවි හෙවත් ස්කන්ද කුමාර දෙවියන් වෙනුවෙන් පහන් ආලෝකය සිදු කිරීම අරමුණු කොට කාර්තික මංගල්‍යය සිදු වේ. ඉල්මහ කච්චිය, ඉල්මහා කාර්තික, කාර්තික මංගල්‍යය නමින් හැඳින්වෙන උත්සවය කතරගම දෙවියන් වෙනුවෙන් සිදුවන වසරේ අවසාන උත්සවය යි. මෙම උත්සවය සිදු කෙරෙන්නේ ඇසළ උත්සවය නිම වී සිව් මසකට පසුව ය. මෙම කාර්තික මංගල්‍යයේ එක් අරමුණක් වන්නේ ස්කන්ද කුමරුගේ උපත කිරීම වන අතර නොවැම්බර් මස යෙදෙන කැති නැකතට අනුව සිදු කිරීම විශේෂත්වය කි (Weerasooriya & Ranaweera, 2025). රුහුණු මහා කතරගම දේවාලයට සාපේක්ෂ ව උඟ්ගල් අලුත් නුවර කතරගම දෙවොලෙහි සිදු කරන කාර්තික මංගල්‍යයෙහි විශේෂතා හා ආවේණික වූ චාරිත්‍ර හඳුනාගත හැකි වේ.

මෙම පර්යේෂණයේ මූලික අභිප්‍රාය වූයේ කතරගම දෙවි අධිගෘහීත වූ උඟ්ගල් අලුත්නුවර කුඩා කතරගම දේවාලයෙහි සිදු කරන කාර්තික මංගල්‍ය චාරිත්‍ර හා පුද පූජාවන්හි අනන්‍යතා ලක්ෂණ පවතී ද යන්න අනාවරණය කිරීමයි. මෙම උත්සවයෙහි එයට ම අනන්‍ය වූ පුද පූජා අන්තර්ගතවන බව පූර්ව අධ්‍යයනවල දී නිරීක්ෂණය විය. විශේෂයෙන් ම හින්දු හා බෞද්ධ ජනතාව මෙන් ම ඇතැම් විට මුස්ලිම් ජනයාගේ ද වන්දනයට පාත්‍රවන රුහුණු මහා කතරගම පුද බිමෙහි පවත්වන කාර්තික මංගල්‍යය බහුවිධ සංස්කෘතික ලක්ෂණවලින් සමන්විත වූවකි. නමුදු උඟ්ගල් අලුත් නුවර පවත්වන

කාර්තික මංගල්‍යය එසේ නොවේ. දිවයින පුරා කතරගම දේවාලය බොහෝ ඇතත් කතරගම දේව උත්පත්තිය නිමිති කොට ගෙන උත්කර්ෂවත් අයුරින් කාර්තික මංගල්‍යය පවත්වන එක ම පරිශ්‍රය වන්නේ ද කතරගම පුද බිම යි. ලංකාවේ බොහොමයක් කතරගම දේවාල ආශ්‍රිතව කාර්තික මංගල්‍යය පැවැත් වුව ද, රුහුණු මහා කතරගම දේවාලයෙහි මෙන් පෙරහැර මංගල්‍යයක් සිදු නොවන අතර එහි දී සිදු වන්නේ අතීතයේ සිට පැවත එන පුද පූජා හා සාම්ප්‍රදායික චාරිත්‍ර සිදු කිරීමක් පමණි. උග්ගල් අලුත් නුවර කුඩා කතරගම දේවාලයෙහි සිදු කරන කාර්තික මංගල්‍යය චාරිත්‍ර හා පුද පූජාවන්හි අනන්‍යතා ලක්ෂණ පවතී ද යන්න අනාවරණය කිරීම සඳහා දිවයිනේ ප්‍රධානතම කතරගම දේවාලය වන රුහුණු මහා කතරගම දේවාලයේ සිදු කරන කාර්තික මංගල්‍යය හා තුලනය කරමින් මෙම අධ්‍යයනය සිදු විය. ඒ සඳහා කාර්තික මංගල්‍යය හා එහි පුද පූජාවල සුවිශේෂතා හඳුනාගැනීම හා මෙම දේවාල ද්විත්වයෙහි පවත්වන කාර්තික මංගල්‍යය පුද චාරිත්‍ර තුලනාත්මකව අධ්‍යයනය කිරීම මඟින් දත්ත රැස් කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයට පූර්වයෙන් පර්යේෂණ ක්ෂේත්‍රය පිළිබඳ වන මූලික අවබෝධය ඇති කර ගැනීම සඳහා සාහිත්‍ය විමර්ශනය සිදු කරන ලද අතර ප්‍රස්තුත උත්සවය පිළිබඳ ව සිදු කෙරුණු පර්යේෂණාත්මක අධ්‍යයනයක් නොමැති බව හඳුනා ගන්නා ලදී. කෙසේ වෙතත් පර්යේෂණයට අදාළ සංස්කෘතික පසුබිම අනාවරණය කරනු වස් සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කිරීම සිදුවිය.

එහිලා කතරගම ඓතිහාසික පසුබිම හා පුද පූජා චාරිත්‍ර පිළිබඳ රචිත සාහිත්‍යය මූලාශ්‍රය කිහිපයක් මෙන් ම උග්ගල් අලුත් නුවර දේවාලයේ ඓතිහාසික පසුබිම පිළිබඳ රචිත සාහිත්‍යය මූලාශ්‍රය ද අධ්‍යයනය කෙරිණි. එම කෘතීන්හි ලාංකේය සමාජයෙහි පවතින පෙරහැර සංකල්පය පිළිබඳ ව මෙන් ම රුහුණු කතරගම ඇසළ මහා පෙරහැර, ගිනි පෑගීම, දිය කැපීම ආදී වාර්ෂික උත්සව පිළිබඳ වාර්තා වී තිබුණ ද වැදගත් සංස්කෘතික අංගයක් වූ කාර්තික මංගල්‍යය අවධානයට ලක්වී නැත (ආටිගල 2015; ද සිල්වා 2023; දේවප්‍රිය 2021; ප්‍රනාන්දු 2005; වික්‍රමගමගේ; 1997, සුමනසේකර; 1993). එසේ ම උග්ගල් අලුත් නුවර කතරගම දේවාලය පිළිබඳ රචනා වූ සාහිත්‍යය මූලාශ්‍රය අන්තර්ගතයෙහි ද දේවාල ඉතිහාසය, පුද පූජා හා චාරිත්‍ර ආදිය පිළිබඳ සටහන් වුව ද කාර්තික මංගල්‍යය හෝ ඒ ආශ්‍රිත පුද පූජා පිළිබඳව වාර්තා නොවේ (ඕවිටිගෙදර 2001; කුලසිංහ 2009; ගමගේ 2016; මද්දුමාගේ 2019;). රුහුණු කතරගම දේවාලයේ කාර්තික මංගල්‍යය පිළිබඳ කෙටි හැඳින්වීමක් අලුත් වැව සෝරත හිමි විසින් රචිත කතරගම පුද සිරිත් (2009) කෘතියෙහි අන්තර්ගත වේ. එහෙත් මෙහි සඳහන් වන්නේ කාර්තික මංගල්‍යය අතීතයේ පැවැත් වූ ආකාරය යි. ඊට අදාළ පුද පූජා හා චාරිත්‍ර පිළිබඳ සාකච්ඡා වී නොමැත. බොහෝ කෘතිවල කාර්තික මංගල්‍යය පිළිබඳ ව නාමික සඳහනක් හෝ නොමැති බව සාහිත්‍ය විමර්ශනයේ දී අනාවරණය විය. කතරගම මෙන්ම කතරගම දෙවියන් පුද ලබන ලංකාවේ අනෙක් දේවාල ආශ්‍රිත සිදු කරන ඇසළ පෙරහැර පිළිබඳ ව සමාජීය වශයෙන් මෙන් ම පර්යේෂණාත්මක ව ද වැඩි අවධානයක් පවතින බව පූර්ව අධ්‍යයනවල දි නිරීක්ෂණය විය. කතරගම පුදබිම ආශ්‍රිත ව සිදු කෙරෙන සිංහල හා දමිළ ජන සංස්කෘති බද්ධ කෙරෙන වැදගත් ආගමික හා සංස්කෘතික උලෙළක් වන ඉල්මහ මංගල්‍යය පිළිබඳ සිදු කෙරී ඇති පර්යේෂණ අවම ය. එපමණක් නොව උග්ගල් අලුත් නුවර කතරගම දේවාල ඉල්මහ කාර්තික මංගල්‍යය පිළිබඳ ප්‍රමාණවත් පර්යේෂණයක් සිදු නොවී ඇති බව අධ්‍යයනවල දී අනාවරණය වූ වැදගත් කරුණකි. ''රුහුණු කතරගම දේවාලයේ ඉල්මහ මංගල්‍යය චාරිත්‍ර සහ පුද පූජා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්''(Weerasooriya & Ranaweera, 2025) යන ලිපිය මඟින් රුහුණු මහා කතරගම දේවාලයේ සිදුවන කාර්තික මංගල්‍යය පිළිබඳ ව සාකච්ඡා වී ඇත. එහෙත් උග්ගල්

අලුත් නුවර කතරගම දේවාලය ආශ්‍රිතව සිදු කෙරෙන වැදගත් ආගමික හා සංස්කෘතික උළෙලක් වන කාර්තික මංගල්‍යය පිළිබඳ ව සිදු කෙරී ඇති පර්යේෂණ අවම වීම හේතුවෙන් ප්‍රදේශීය වශයෙන් මෙම ආගමික උත්සව ද්වය දක්වන සුවිශේෂතා විශ්ලේෂණය වීමක් පූර්වයෙන් සිදු කර නැත. සමාන ආගමික ප්‍රස්තුතයක් මත ගොඩනැගුණු සංස්කෘතිකාංග දෙකක ගති ලක්ෂණ තුලනය කරණු වස් මෙම පර්යේෂණය, ක්ෂේත්‍ර අධ්‍යයනය මූලික කොට ගනිමින් තුලනාත්මක අධ්‍යයනයක් ලෙස සිදු කරන ලදී.

ඒ අනුව මෙම පර්යේෂණය මගින් රුහුණු කතරගම දේවාලයේ සහ උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ ඉල්මහ කාර්තික මංගල්‍යයේ චාරිත්‍ර හා පුද පූජා අධ්‍යයනය කෙරිණි. විශේෂයෙන් ම කතරගම මහා දේවාලය ආශ්‍රිත අනෙකුත් උත්සව හා පෙරහැර හා සැසඳීමේ දී ඇතැම් විට මූලික ලක්ෂණ අතින් සාම්‍යයක් පෙන්නුම් කළ ද මෙම උත්සවයේ අභිප්‍රේරාර්ථ හා බැඳුණු චාරිත්‍රමය වෙනස්කම් හඳුනාගත හැකි බව ක්ෂේත්‍ර අධ්‍යයනයන්ගෙන් පැහැදිලි විය. එසේ ම උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ පුද පූජා උක්ත මංගල්‍යය උත්සවාකාරයෙන් සිදු නොවන අතර මෙම ඉල්මහ පෙරහැර මංගල්‍යය පිළිබඳ සමාජීය දැනුවත්භාවය, පුද්ගල අවබෝධය හා ව්‍යාප්තිය අල්ප වේ. රුහුණු මහා කතරගම දේවාල පුද පූජා සිදු කිරීමේ නිල රාජකාරි මණ්ඩලය පෙරහැර මංගල්‍යය සඳහා පොදුවේ සහභාගි වන අතර රාජකාරි මණ්ඩලය එක් එක් පෙරහැර මංගල්‍යය සඳහා විශේෂිතකරණයක් නොමැති ව පාරම්පරික රාජකාරි කතරගම දෙවියන් උදෙසා සිදු කෙරේ. ලංකාව පුරා ව්‍යාප්ත ව කතරගම දේවාලය රාශියක් ඇතත් ඉල්මහ මංගල්‍ය චාරිත්‍ර අතරට පූජාවක් වශයෙන් වීථි පෙරහැරක් එක්වන එක ම ස්ථානය රුහුණු මහා කතරගම ඉල්මහා මංගල්‍යය යි (Weerasooriya & Ranaweera, 2025). කතරගම පුද බිමෙහි මෙන් සිංහල දමිළ මිශ්‍ර සංස්කෘතික ලක්ෂණයක් ප්‍රකට නොවන මෙහි බෞද්ධ දර්ශනය හා පාරම්පරික වත් පිළිවෙත් මූලික වෙමින් ඉල්මහා කාර්තිකය උග්ගල් අලුත් නුවර සිදු වීම විශේෂත්වයකි.

උක්ත පසුබිම කේන්ද්‍ර කර ගනිමින් උග්ගල් අලුත්නුවර කුඩා කතරගම දේවාලයෙහි කාර්තික මංගල්‍යයට ප්‍රදේශීය වශයෙන් ආවේණික වූ පුද පූජා සංස්කෘතියක් පවතීද යන්න අනාවරණය කිරීම සඳහා දිවයිනේ ප්‍රධානතම කතරගම දේවාලය වන රුහුණු මහා කතරගම දේවාලයේ සිදු කරන කාර්තික මංගල්‍යය හා තුලනය කරමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. ඒ සඳහා මෙම කතරගම දේවාල ද්විත්වයෙහි ඉල්මහ කාර්තික මංගල්‍යය හා එහි පුද පූජා, චාරිත්‍ර වාරිත්‍ර හා ඒවා පවත්වන ස්වභාවය හඳුනාගැනීම, විශේෂත්වය අනාවරණය ගැනීම යන අරමුණු මූලික කොට ගනිමින් දත්ත රැස් කරන ලදි. විශේෂයෙන් ම කතරගම පුද බිම හා සම්බන්ධ ඉල්මහා කාර්තික පෙරහැර මෑත කාලයේ යම්තාක් දුරකට සමාජගත ව හා ජනප්‍රිය ව පවතින නිසා එම පෙරහැර හා සසඳමින් උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ ඉල් මහා කාර්තික පෙරහැරේ පුද පූජා රටාව අධ්‍යයනය කරන ලදි.

## 2. ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයක් වූ තේමාත්මක විශ්ලේෂණය භාවිත කරමින් සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙහි දී ශ්‍රී ලාංකේය අස්පර්ශනීය සංස්කෘතික අංගයක් අධ්‍යයනයට භාජනය වේ. එහි දී විවරණය කරනුයේ පුද්ගල ආකල්ප, පුද්ගල

හැසිරීම්, ආගමික චර්යා විධි අධ්‍යයනය සිදු කරන ලද හෙයින් මානවවංශ පර්යේෂණයක් වශයෙන් ගොඩ නඟන ලදී. රුහුණු මහා කතරගම දේවාලයට සහ උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයට අදාළ ඓතිහාසික දත්ත අනාවරණය කර ගැනීමට ද සිදු වූ හෙයින් ඓතිහාසික පර්යේෂණ කාණ්ඩයට ද මෙම පර්යේෂණය ගිණිය හැකිය. එසේම සන්දර්භ ද්විත්වයක ආගමික පුද පූජා හා පුද්ගල චර්යා මූලික වෙමින් ඒවායේ අර්ථ හා භාවිතය පදනම්ව අදහස් උද්දීපනය සිදු වන නිසා සංකල්පීය විශ්ලේෂණය ද දත්ත විශ්ලේෂණයේ දී භාවිත විය. රැස් කර ගන්නා ලද දත්ත පර්යේෂකයා මඟින් අර්ථ නිරූපණය කරමින් නිගමනයන්ට එළඹෙමින් අර්ථ නිරූපණවාදී ප්‍රවේශයක් දත්ත විශ්ලේෂණයට යොදා ගැණිනි. එය විෂයමූලවාදී (Subjectivism) පදනමක් සහිත පර්යේෂණයක දී සිදු වන කාර්යාවලිය යි.

මානවවංශ පර්යේෂණයන්හි දත්ත රැස්කර ගැනීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන වන අතර පුස්තකාල අධ්‍යයනය ද යොදා ගන්නා ලදී. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීයික මූලාශ්‍රය ද භාවිත කෙරිණි. ක්ෂේත්‍ර අධ්‍යයනයන්හි දී සම්මුඛ සාකච්ඡා හා ඍජු නිරීක්ෂණ යන ප්‍රාථමික මූලාශ්‍රය මඟින් දත්ත රැස්කර ගත් අතර දත්ත රැස් කිරීමේ දී සම්මුඛ සාකච්ඡාවලට අදාළ නියැදිය තෝරා ගැනීමේ නියැදීමේ ක්‍රම වශයෙන් හිමබෝල නියැදි ක්‍රමය හා අභිලාශී නියැදි ක්‍රමය භාවිත විය.

සම්මුඛ සාකච්ඡා සඳහා දත්ත දායකයන් වශයෙන් රුහුණු මහා කතරගම දේවාලයේ හා උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ සංස්කෘතිය පිළිබඳ සාධනීය දැනීමක් සහිත සහ චාරිත්‍ර පිළිබඳ ව අවබෝධයක් සහිත විදග්ධයන්, බස්නායක නිලමේ, තේවාව භාර කපු මහතුන්, අනෙක් නිලධාරීන් හමු වී ඔවුන්ගෙන් ගුණාත්මක කරුණු ලබා ගත් අතර, තේවාව සිදු කරන පාරම්පරික වාදන ශිල්පීන් කිහිප දෙනෙකු (එහි දී උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ දවුල් වාදන ශිල්පීන් හා හේවිසි, තම්මැට්ටම් වාදන ශිල්පීන් ද රුහුණු මහා කතරගම දේවාලයේ දවුලු වාදන ශිල්පීන් සහ හේවාසි වාදන ශිල්පීන්) ද උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ ආලත්ති අම්මාවරුන් හතර දෙනෙකු සහ රුහුණු මහා කතරගම දේවාලයේ ආලත්ති අම්මාවරු අට දෙනෙකු හමු වී ඔවුන්ගෙන් නිවැරදි සහ ගුණාත්මක තොරතුරු, සංස්කෘතික අනන්‍යතාව විමසමින් පර්යේෂණයට අවශ්‍ය දත්ත එක් රැස් කර ගැනීම සිදු විය.

ක්ෂේත්‍ර අධ්‍යයනය මූලික වශයෙන් සිදු කරන මෙම පර්යේෂණයට අදාළ ඍජු නිරීක්ෂණ සඳහා රුහුණු මහා කතරගම දේවාලයේ සහ උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ වාර්ෂික උත්සවක් වන කාර්තික මංගල්‍යය (ඉල් මහ මංගල්‍යය) යොදා ගනිමින් පුද පූජා හා සංස්කෘතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීම සිදු විය. එමෙන්ම මෙම දේවාල ද්විත්වයෙහි ම කපු මහතුන් සිදු කරන චාරිත්‍ර විධි හා හැසිරීම්, පාරම්පරික වාදන ශිල්පීන් හා ආලත්ති අම්මාවරුන් සහ විශේෂයෙන් උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ දිග්ගේ නර්තනයේ යෙදෙන කාන්තාවන් සමාජ හැසිරීම් හා සිදු කරන චාරිත්‍ර වාරිත්‍ර නරඹා කාර්තික මංගල්‍යයේ සුවිශේෂ වත් පිළිවෙත් හා ඊට අදාළ සම්ප්‍රදාය පිළිබඳ ව අධ්‍යයනය විය. මෙහි දී වන විට 2023, 2024 වර්ෂයේ කාර්තික මංගල්‍යය සහ ඒ ආශ්‍රිත චාරිත්‍ර පූර්ව ක්ෂේත්‍ර අධ්‍යයනයට භාජනය කරන ලදී. ද්විතීයික මූලාශ්‍රය මඟින් දත්ත රැස්කිරීමේ දී ග්‍රන්ථ, පුවත්පත් පරිශීලනය හා ලිපි ලේඛන පරිශීලනය සිදුකරනු ලැබීය.

## 3. සාකච්ඡාව

### 3.1 රුහුණු මහා කතරගම දේවාලයේ සහ උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ කාර්තික මංගල්‍යයේ පුද පූජා

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි ස්ථාපිත කතරගම මහා දේවාල අතර ඉල්මහ මංගල්‍යය සඳහා වීථි සංචාරය කෙරෙන පෙරහැරක් සහිත පුද පූජා සිදුවන එක ම ආගමික ස්ථානය රුහුණු මහා කතරගම දේවාලය යි. උග්ගල් අලුත්නුවර කුඩා කතරගම දේවාලය, බදුල්ල කුඩා කතරගම දේවාලය වැනි ලංකාවේ විවිධ ප්‍රදේශ ආශ්‍රිත ව පවත්නා අනෙකුත් කතරගම දේවාලවල ද ඉල්මහ මංගල්‍ය ආශ්‍රිත පුද පූජා චාරිත්‍ර සිදු වේ. නමුත් වීථි පෙරහැරක් සිදුවන්නේ රුහුණු මහා කතරගම දේවාලයේ පමණි (Weerasooriya & Ranaweera, 2025). උග්ගල් අලුත් නුවර ඉල්මහ මංගල්‍යය චාරිත්‍ර සිදු කිරීමේ දී රාජකාරි මණ්ඩලය ප්‍රමුඛ මලුවේ පෙරහැරක් සිදු වන අතර උඩරට ප්‍රදේශ ආශ්‍රිත ව කාර්තික මංගල්‍යය සිදු වන්නේ පහන් දැල්වීමෙනි. රුහුණු මහා කතරගම දේවාලයේ ඉල්මහ මංගල්‍යය පෙරහැර සංස්කෘතියෙහි චාරිත්‍ර ධාරා ත්‍රිත්වයක් යටතේ විග්‍රහ කළ හැකි ය (Weerasooriya & Ranaweera, 2025).

- පූර්ව චාරිත්‍ර
- පෙරහැර පවත්වන දින සිදු කරන චාරිත්‍ර
- පෙරහැර පැවැත්වීමෙන් පසු චාරිත්‍ර

පූර්ව චාරිත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පුරාණ චාරිත්‍ර, නක්ෂත්‍රානුකූල ව පුරාණ සාම්ප්‍රදායික වත් පිළිවෙත්වලට අනුගත ව සිදුකෙරේ. ඇසළ මහා පෙරහැර, අලුත් අවුරුදු පෙරහැර මෙන් ම ඉල්මහ පෙරහැර සිදු වන්නේ ද නැකැත් මූලික වෙමිනි. ඉල් මහා මංගල්‍යයෙහි විශේෂත්වය වන්නේ එය කැති නැකත මූලික කොට ගෙන සිදු වීම යි. මෙදින පූර්ණ චන්ද්‍රයා උදා වන්නේ සුබ ග්‍රහයෙකු සමඟ ය. එනිසා එදින විශේෂිත දවසක් වේ. එමෙන් ම මෙම කැති නැකත පසළොස්වක පොහොය මුල් වී යෙදීම ද විශේෂත්වයකි. නොවැම්බර් මස ඉල් පොහෝ දිනට කැති නැකත නොයෙදුණහොත් බෙරණ, රෙහෙණ නැකැත් පිළිබඳ අවධානය යොමු කෙරෙන එසේත් නැතහොත් උඳුවප් පුර පොහෝ දිනට යෙදෙන කැති, බෙරණ, රෙහෙණ නැකතක් අනුව මෙම ඉල් මංගල්‍යය සිදු කෙරේ. උක්ත නක්ෂත්‍ර නියමයන්ට අනුව 2025 වර්ෂයේ ඉල්මහ පෙරහැර නොවැම්බර් මස දී නොව උඳුවප් මස පෝය දිනට යෙදී තිබූ බව අධ්‍යයනයේ දී අනාවරණය විය. 'කැති' නැකත උදාවන තෙක් දෙවියන් දෙවොලෙන් පිටතට වැඩම වීම සිදු නොකෙරේ. එසේ ම මෙම කැති නැකත පූර්ණ විය යුත්තේ ද පොහොය දිනය මූලික කර ගනිමිනි. නැකැත් සෑදීමේ දී කැති නැකත රාත්‍රී කාලයේ යෙදිය යුතු අතර ම පොහොය දිනයක් ද විය යුතු ය යන කාරණා ද්විත්වය සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙයි. නමුත් උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ උක්ත සඳහන් චාරිත්‍ර ත්‍රිත්වය සිදුවන අතර මෙහි පවතින විශේෂත්වය වන්නේ පූර්ව චාරිත්‍රවල දී පෙරහැර පහක් සඳහා නැකැත් බැලීම සිදු වීමයි. ඉල් පොහොය දින අවසන් පෙරහැර සිදුවන අතර එදිනට දින සතරකට පෙර කාර්තික උත්සවයේ පෙරහැර සිදු කිරීම ඇරඹේ. වර්තමානයෙහි ද කාර්තික උත්සවය එනම් ඉල්මහ මංගල්‍යය නොවැම්බර් මස පුන් පොහෝ දින පැවැත්වෙන අනිවාර්ය උත්සවයක් ලෙස සිදු කරනු ලැබේ. මෙම දෙවොලෙහි සිදුවන කාර්තික පෙරහැර මළුවේ පෙරහැර ලෙස නාමකරණය වේ. මෙම පෙරහැර මංගල්‍යය දින පහක් පුරා

පැවැත්වෙන අතර එය සිදු වන්නේ නැකැත් චාරිත්‍ර අනුව ය. එනම් මළුවේ පෙරහැර පහ සිදු වන්නේ නැකැත් පහක් අනුව ය.

රුහුණු මහා කතරගම දේවාලයේ කාර්තික මංගල්‍යයේ පෙරහැර දින සිදු කරන චාරිත්‍ර වාරිත්‍ර බොහොමයක් කතරගම ඇසළ පෙරහැර මංගල්‍යයට හා අලුත් අවුරුදු පෙරහැරට සමාන ව සිදු කරයි. ඇසළ පෙරහැර රුහුණු මහා කතරගම දේවාලයේ ප්‍රධානතම පෙරහැර වුවත් ඉල් මහා පෙරහැර ද ඊට නොදෙවෙනි ව සමාන චාරිත්‍ර සහිත ව ඉදිරිපත් කෙරේ. ඒ අතර දවුල හං කිරීම, වත බැඳීම ආරම්භය, දෙවියන් වැඩම වීම හා පෙරහැර ආරම්භ කිරීම, බස්නායක නිලමේ ගමන් කිරීම, වල්ලි අම්මා දේවාලයට පෙරහැර ගෙවැදීම, වල්ලි අම්මා දේවාලයේ මුරුතැන් පූජාව සිදු කිරීම, නැවත පෙරහැර මහා දේවාලය වෙත ගමන් කිරීම, මහා දේවාලයට ගෙවැදීම, මුරුතැන් පූජාව සිදු කිරීම, දෙවේලේ පෙරහැර ගමන් කිරීම ආදී චාරිත්‍ර පෙරහැර දින සිදු කරන චාරිත්‍ර වන අතර මෙම චාරිත්‍ර හා පුද පූජා රුහුණු මහා කතරගම දේවාල පෙරහැර සංස්කෘතියේ දී භාවිත වන්නේ පෙරහැර මංගල්‍යයේ ස්වභාවය අනුව ය. උක්ත සඳහන් අයුරින් පාරම්පරික ව පැවත එන චාරිත්‍ර රාශියක් රුහුණු මහා කතරගම පෙරහැර මංගල්‍යය ආශ්‍රිත ව සිදු වේ. පෙරහැර මංගල්‍යයන්හි දී එක් එක් කාර්යභාරය සඳහා සුවිශේෂී පුද්ගලයෝ සිටිති. අතීතයේ සිට පැවත ආ කාර්යභාර ධුරාවලිය විවිධ පුද්ගල කොටස් වෙත පැවරී ඇත. මේවා සිදු වන්නේ නිල පංගු ක්‍රමයක් මත ය. නිලයක් ලෙස නාමකරණය වන්නේ තනතුර ය. මෙහි දී කපු මණ්ඩලයේ සිට පාවාඩ නිලය තෙක් රාජකාරි වර්ගීකරණය වේ.

උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ දී චාරිත්‍රානුකූල පෙරහැර මංගල්‍යයක් සිදු වන අතර පෙරහැර වීදි සංචාරය කිරීමක් සිදු නොවේ. දින හතරක් පෙරහැර මංගල්‍යය අවසානයේ දී ද මුරුතැන් පූජාව සිදු කරන අතර පස්වැනි දින අවසන් පෙරහැර අවසානයේ මුරුතැන් පූජාව පැවැත්වීමෙන් මෙම උත්සව මංගල්‍යය අවසන් වේ. මෙය සිදු වන්නේ හේවිසි සහ හොරණෑ නාදය මධ්‍යයේ ය. නිල් පන්දම රැගෙන ඒම, බණ්ඩාරවරුන් හා නෛයියන්ඩි පංගුව දකුණු අත නැටීම, දිග්ගේ නැටීම, නෛයියන්ඩි පංගුවේ කෝලම් මුහුණු නැටීම ආදි විශේෂිත අංග කිහිපයක් උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ කාර්තික මංගල්‍යයට අයත් වේ. නීල පන්දම රැගෙන ඒම සිදු වන්නේ දේව ආභරණ දේවාලයෙන් පිටතට වැඩම වීමට පෙර ය. එහි දී ආවතේව සිදු කරන කපු මහතෙකු විසින් දේවාල රාජකාරි ආරම්භ කරන බව ප්‍රකාශ කෙරේ. 'නීල පන්දම රැගෙන වරෙන් රාජකාරි ආරම්භ කරන්න' යන විධානයෙන් පසුව දේවාල පූජාව සහ හේවිසි වාදනය ආරම්භ කිරීම කෙරේ. නීල පන්දම රැගෙන පැමිණෙන්නේ ආවතේවකරුවෙකු විසිනි. උක්ත චාරිත්‍රයෙන් පසුව දේවාභරණ වැඩම දේවාලයේ ඇතුළු ගේ සිට පෙරහැර සඳහා වැඩම වීම සිදු වේ. මෙම පෙරහැරේ විශේෂත්වය වන්නේ රුහුණු මහා කතරගම දේවාලයේ දී මෙන් දීර්ඝ පෙරහැරක් හෝ එය වීදි සංචාරයක් සිදු නොවීම යි. චාරිත්‍රානුකූල ව තූර්ය වාදනය මධ්‍යයේ දේව ආභරණ මළුව වටා වැඩම වීම පමණක් සිදු කෙරේ. දේවාභරණ දෙවොලින් පිටතට වැඩම වීමෙන් අනතුරුව බෝධිය සහිත මළුවේ දී මෙම උග්ගල් අලුත් නුවර කාර්තික මංගල්‍යය සඳහා පමණක් ආවේණික නර්තන ද්විත්වයක් සිදු වන අතර එය හඳුන්වන්නේ බණ්ඩාරවරුන් හා නෛයියන්ඩි පංගුව දකුණු අත නැටීම සහ නෛයියන්ඩි පංගුවේ කෝලම් මුහුණු නැටීම ලෙස ය.

රුහුණු මහා කතරගම දේවාලයේ සහ උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ කාර්තික මංගල්‍යය නැතහොත් ඉල්මහා මංගල්‍යයේ පෙරහැර දින චාරිත්‍ර පහත පරිදි විග්‍රහ කළ හැකිය.

| රුහුණු මහා කතරගම දේවාලය | උග්ගල් අලුත් නුවර කතරගම දේවාලය |
|---|---|
| දවුල හං කිරීම. | ආරම්භක දවුල් හේවිසි වාදනය. |
| වත බැඳීම ආරම්භය. | හක් ගෙඩි, හොරණෑ නාදය මධ්‍යයේ පාවඩ එළීම. |
| කැති නැකත මූලික කරගනිමින් දෙවියන් වැඩම වීම. | විධානය දීම සහ නීල පන්දම රැගෙන ඒම. |
| පෙරහැර ආරම්භ කිරීම. (මඟුල් වීදියේ) | නැකැත් චාරිත්‍ර අනුව දේව ආභරණ වැඩම වීම. |
| තේවාන් අම්මා දේවාලයේ පහන් ආලෝක පත්තු කිරීම. | මළුවේ පෙරහැර ගමන් කිරීම. |
| කෙටි නඩත්තු වාදනය. | මළුවේ පෙරහැර නතර කොට බණ්ඩාරවරුන්ගේ දකුණු අත් නැටීම. |
| වල්ලි අම්මා දේවාලයට පෙරහැර ගෙවිදීම. | නෛයන්ඩි පංගුවේ දකුණු අත් නැටීම. |
| වල්ලි අම්මා දේවාලයේ මුරුතැන් පූජාව සිදු කිරීම. | නෛයන්ඩි පංගුවේ කෝළම් මුහුණු නැටීම. |
| නැවත පෙරහැර මහා දේවාලය වෙත ගමන් කිරීම. | පෙරහැර මළුව වටා ගමන් කිරීමෙන් අනතුරුව නැවත දේවාලයට ගෙවිදීම. |
| මහා දේවාලයට ගෙවැදීම. | මුරුතැන් පූජාව සිදු කිරීම. |
| මුරුතැන් පූජාව සිදු කිරීම. | දිග්ගේ නර්තනය සිදු කිරීම |
| ආලත්ති පූජාව සිදු කිරීම. | ආලත්ති පූජාව සිදු කිරීම. |

(කර්තෘ, ක්ෂේත්‍ර අධ්‍යයන, 2024)

උග්ගල් අලුත්නුවර කුඩා කතරගම දේවාලයේ සිදු වන එක් චාරිත්‍රයක් වන බණ්ඩාරවරුන්ගේ දකුණු අත් නැටීමේ නර්තනයේ දී නර්තනය ඉදිරිපත් කරන්නා සම්පූර්ණ සුදු වතින් සැරසී හිසට සුදු ජටාවක් බැඳ පළමුව දකුණු අත දේව ආභරණ සහිත දෝලාව දෙසට දිගු කොට ශ්ලෝක ගායනය සිදු කෙරේ. මෙහි දී නර්තන වස්ත්‍ර හෝ ආභරණ භාවිත නොකෙරේ. පහත සඳහන් වන්නේ නර්තනයට පෙර ගායනය කෙරෙන ශ්ලෝකයකි.

*'පූජිතං මයුර වාහන දේවිතං*
*දිව්‍ය තුලයානං පුර*
*කදිර දේව රාජං*
*පාද පත්ම නමාමි....'*

අනතුරුව සබරගමු දවුල් වාදනයට අනුව නර්තනය සිදු කෙරේ. නෛයන්ඩි පංගුවේ දකුණු අත් නැටීමේ දී එම නර්තනය ඉදිරිපත් කරන ශිල්පීන් ද සුදු පැහැ සරම සහ කමිසය නර්තන ඇඳුම් ලෙස භාවිත කරන අතර ඉනට රතු රෙදිකඩක් බඳිනු ලැබේ. ශ්ලෝක ගායනයෙන් පසුව නර්තනය ආරම්භ වන අතර එය සිදු වන්නේ ද දේව ආභරණ සහිත දෝලාව ඉදිරිපස දී ය. මෙම දකුණු අත් නැටීමේ නර්තන චලනයන්ගේ වැදගත් ලක්ෂණය වන්නේ සාම්ප්‍රදායික සබරගමු නර්තන හැඩ තල හා අංග චලන ලක්ෂණ සහිත ඉදිරිපත් කිරීම් වුව ද, ඒවා ක්‍රමානුකූල චලනය නොවීම යි. එසේ ම නෛයන්ඩි පංගුවේ කෝලම් මුහුණු නැටීමේ නර්තනය වෙස් මුහුණු පැළඳ සිදු කරන නර්තනයක් වන අතර එහි

දී දකුණු අතෙහි මුගුරක් සහිත ව මෙම නර්තනය ඉදිරිපත් කෙරේ. උක්ත සඳහන් කරන ලද නර්තන ද්විත්වය බෝධිය සහිත මළුවේ දී පමණක් ඉදිරිපත් කරන අතර අනතුරුව කතරගම දෙවියන්ගේ දේවාභරණ බෝධිය සහිත මළුවේ වැඩම වන්නේ සහ නැවත දේවාල අභ්‍යන්තරයෙහි තැම්පත් කරන්නේ තූර්ය වාදනය භාවිතයෙනි. එහි දී වෙනත් කිසිදු නර්තන අංග හෝ වාදන අංග අන්තර්ගත නොවේ.

උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ කාර්තික මංගල්‍යයෙහි පෙරහැරේ වැඩම වූ දේවාභරණ නැවත දේවාලය අභ්‍යන්තරයේ තැම්පත් කිරීමෙන් අනතුරුව කතරගම දෙවියන් උදෙසා පූජාව පැවැත්වෙන අතර එහි දී ආලත්ති අම්මාවරුන් විසින් ආලත්ති පූජාව සහ තවත් කාන්තාවන් කිහිප දෙනෙකු විසින් දිග් ගේ නර්තනයත් සිදු කෙරේ. රුහුණු මහා කතරගම දේවාලයෙහි දී ද කතරගම දෙවියන් උදෙසා කාර්තික පෙරහැරෙන් පසුව ආලත්ති පූජාව සිදු කළ ද, එහි දී දිග්ගේ නර්තනයක් සිදු නොවේ. මෙම දිග්ගේ නර්තනය උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයට ආවේණික වූ විශේෂිත වූ පූජා අංගයකි.

රුහුණු මහා කතරගම දේවාලයේ පෙරහැර මංගල්‍යයෙන් පසු සිදු කරන පුද සිරිත් පිළිබඳ අධ්‍යයනයේ දී රුහුණු මහා කතරගම දෙවොලට අයත් දිරාපත් වූ දෑ, කතරගම මැණික් ගඟේ එක් දිය තොටක් වන "දිය මුදුන් තොටින්" පා කිරීම ඉල්මහ මංගල්‍යයේ දී සිදු කෙරෙන විශේෂිත වූ චාරිත්‍රයක් ලෙස හඳුනාගත හැකි විය. විවිධ අවශ්‍යතාවන් සඳහා මැණික් ගංගාවේ තොටුපොළ කිහිපයක් යොදා ගැනේ. ''කතරගම මහා දේවාලය හා සම්බන්ධ විවිධ අභිචාර විධිවල දී, දුටුගැමුණු රාජ්‍යය සමයේ සිට අද දක්වා විවිධ කාර්යයන් සඳහා මෙකී තොටුවල් භාවිත කරනු ලැබේ. මැණික් ගඟ ශුද්ධ නදියක් ලෙස පූජනීයත්වයට පත්වීමට ද මෙය හේතුවන්නට ඇත'' (සිල්වා, 2023). ඉල්මහ මංගල්‍යයේ දී කතරගම දෙවොලට අයත්ව තිබූ භාවිතයට ගත නොහැකි දිරාපත් වූ දෑ පා කර හරින්නේ මෙම දිය තොටිනි (Weerasooriya & Ranaweera, 2025).

පෙරහැර මංගලයයට පසු චාරිත්‍ර උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ සිදු නොවන අතර අවසන් දින විහාර මළුවේ විශේෂ පහන් පූජාවක් පැවැත්වෙන අතර මෙම පෙරහැර මංගල්‍යය අවසන් වන්නේ යාබද දේවාලයක් වන පත්තිනි දේවාලයේ පහන් මඩුවක් පැවැත්වීම සඳහා කප සිටු වීමෙනි. මෙහි දී පෙරහැර සඳහා සහභාගි වන සියලු දෙනා කප සිටුවන පත්තිනි දේවාලය වෙත ගමන් කරන අතර එහි දී කප සිටුවන පංගුවෙන් සූදානම් කර තබන ලද රුක්අත්තන දෙබල (කිරි කණුව) රැගෙන පත්තිනි දේවාලය වෙත ගමන් කෙරේ. මෙහි දී සිදු වන්නේ ලෙඩ දුක් මඟ හරවා ගැනීම හා ගම් වැසියන්ට සෙත් පැතීම සඳහා පහන් මඩුවක් පැවැත්වීමේ කාර්යය පත්තිනි දේවාලයට භාර දීමයි. කපු මහතා නියමිත නැකත අනුව පත්තිනි දේවාලය ඉදිරියේ කපකණුව සිටුවා පොල් ගෙඩි ද්විත්වයක් ගැට ගසා ගොප් කොළවලින් ගොප් ගෙඩි සාදා බැඳ සරසයි. පත්තිනි දේවිය ඉදිරියේ පහන් මඩුවක් සිදු කරන බවට පොරොන්දු වන කප සිටු වීමේ චාරිත්‍රය ලෙස මෙය හැඳින්විය හැකි ය. මෙම පහන්මඩු ශාන්තිකර්මය දෙසැම්බර් මස අවසන් වීමට පළමුව පැවැත්විය යුතු අතර කප සිටු වීමෙන් සශ්‍රීකත්වය සංකේතවත් කරන අතර ජනතාවට සෙත් පැතීම ප්‍රධාන කාර්යය බවට පත් වේ. එසේ ම මෙම පහන්මඩුව පැවැත්වීමේ දී අදාළ පංගුකරුවන් ඉටු කළ යුතු රාජකාරි පාරම්පරික සේවයක් ලෙස සිදුවන අතර ''එහි දී දේවාලය වටා එළිපෙහෙළි කර සැරසිලි කිරීම කපුමහතුන්ටහට පැවරෙන කාර්යයකි. දේවාලයේ වියන් බැඳීම, පිරුවට සපුරාගෙන පාලි පන්දම් සහ අත් පන්දම් බැඳීම, දේව ආභරණ වැඩම

වීමේ දී පියවිලි එළීම සහ වියන ඇල්ලීම යන කටයුතු රදා පංගුවෙන් කළ යුතු ය (මද්දුමාගේ, 2019, පි. 76). එමෙන්ම කාර්තික මංගල්‍යය පැවැත්වීම සඳහා මුදල් සපයා ගැනීමේ දී වාර්ෂිකව දේවාලයෙන් වී අමුණක් ලබා ගැනීමෙන් එහි ඵලදාවෙන් ලැබෙන මුදල් සහ ගම්මු විසින් දෙවියන්ට වෙන් කරනු ලබන වී එක්රැස් කිරීමෙන්, ආධාර මුදල් එකතු කිරීමෙන් ලැබෙන මුදල් උපයෝගී කර ගනී.

ස්කන්ද කුමාර නොහොත් කතරගම දෙවියන් කේන්ද්‍රීව පවත්නා උග්ගල් අලුත් නුවර සහ කතරගම මහා දේවාලයන්හි වාර්ෂික උත්සවයක් වන ඉල් මහා මංගල්‍යය සමාන කාලසීමාවක දී සමාන අරමුණු සහිත ව සිදු කරන්නේ වුව ද දේවාල ද්වයෙහි චාරිත්‍ර වාරිත්‍රයන්හි සුවිශේෂතා එකිනෙකට අනන්‍ය ව පවත්නා බව අධ්‍යයනයේ දී තහවුරු විය. ජනශ්‍රැතිය යනු සංස්කෘතියේ කැටපතකි. *''ජනශ්‍රැතිය එය උපන් හා ව්‍යවහාර වන්නා වූ ජන සමූහයාගේ ජීවන ශෛලිය, ජන ජීවිතය, සංස්කෘතිය හා වෙනත් ක්‍රියාකාරකම් සමඟ එකට බැඳී පවතී. ඒ වටපිටාවෙන් ඉවතට ගෙන ජනශ්‍රැතිය දෙස බැලීම නොකළ යුතුය. අප ජනශ්‍රැතිය තේරුම් ගත යුත්තේ ඒ ජනශ්‍රැතිය පවත්නා වූ සමාජ, සංස්කෘතික වටපිටාව හා ඒකාබද්ධ කොටගෙන ය. ජනශ්‍රැතිය තුළින් දිස්වෙන සමාජ, සංස්කෘතික අනන්‍යතාව හරි හැටි අවබෝධ කරගත හැකි වන්නේ එවිට ය"* (රත්නපාල, 1995). ජනශ්‍රැතිය පුද පූජා හා විශ්වාස ප්‍රාදේශීය සමාජ සංස්කෘතික තත්වය ප්‍රකට කරයි. රුහුණු මහා කතරගම දේවාලය හා උග්ගල් අලුත් නුවර කුඩා කතරගම දේවාලයේ කාර්තික මංගල්‍යය චාරිත්‍ර හා පුද පූජා අධ්‍යයනයේ දී උක්ත ප්‍රාදේශීය සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන වේ.

උග්ගල් අලුත් නුවර මෙම දේවාලය බලංගොඩ නගර ආසන්නයේ ස්ථාපිතව පවතින හෙයින් සබරගමු සම්ප්‍රදායේ ලක්ෂණ බොහොමයක් මෙම පුද පූජා හා චාරිත්‍ර සුලබ ය. සබරගමු සම්ප්‍රදායේ දී සිංහල දේව සංකල්ප පිළිබඳ විශ්වාස හා පුද පූජා ජනයා අතර ප්‍රබල ලෙස පවතින අතර මෙහි දී සමන්, පත්තිනි, අලුත් නුවර දැඩිමුණ්ඩ ආදි දෙවියන් උදෙසා පුද පූජා සිදු කිරීම ප්‍රදේශීය අනන්‍යතාවකි. මෙම ලක්ෂණය උග්ගල් අලුත් නුවර කුඩා කතරගම දේවාලයේ දී මැනවින් දෘශ්‍ය වේ. අලුත් නුවර සිදුවන කාර්තික මංගල්‍යයේ බොහොමයක් චාරිත්‍ර සිංහල අනන්‍යතාව විෂද කරන අතර මේ සඳහා දිග්ගේ නැටීම, නෛයන්ඩි පංගුවේ කෝළම් මුහුණු නැටීම, පත්තිනි දේවාලය මූලික වෙමින් පහන් මඩුව සඳහා කප් සිටුවීම වැනි චාරිත්‍ර සිදු කිරීම නිදසුන් වේ.

උග්ගල් අලුත් නුවර කුඩා කතරගම දේවාලයට සාපේක්ෂව රුහුණු මහා කතරගම දේවාලයේ ඉල්මහා මංගල්‍යයේ සිදු කරන චාරිත්‍ර හා පුද පූජා සම්ප්‍රදායේ දී ද්‍රවිඩ ආභාසය මැනවින් පිළිබිඹු වන බව එම අධ්‍යයනයේ දී ගම්‍යමාන වේ. කතරගම පුද චාරිත්‍ර සිදු කිරීමේ දී රුහුණු මහා දේවාලයට අමතරව වල්ලි අම්මා දේවාලය සහ තේවානි අම්මා දේවාලය ද ඒ හා සම්බන්ධ වේ (Weerasooriya & Ranaweera, 2025). විශේෂයෙන් කතරගම දෙවියන් සුර අසුර යුද්ධයේ දී ලැබූ ජයග්‍රහණය හා කතරගම දෙවියන්ගේ උපත සැමරීම ඉල්මහ මංගල්‍යයේ අරමුණු අතර වේ. කතරගම දී ද්‍රවිඩ ආභාසය සම්මිශ්‍ර වීම සඳහා එම ප්‍රදේශිය සංස්කෘතියේ හා දේවාලයේ පවතින බහු සංස්කෘතික ලක්ෂණ මූලික වී ඇත. කතරගම පුද බිමේ ප්‍රධාන දේවාලයට අමතරව හින්දු දේව සම්ප්‍රදාය අනුගමනය කරමින් පුද පූජා සිදු වන දේවාල රාශියක් පවතී. එනම් ශිව දේවාලය, කාලි දේවාලය, ගනේශ දේවාලය ආදිය යි. මෙම සියලු දෙවියන් ද්‍රවිඩ සංස්කෘතියේ දී පුද ලබන අතර පුද පූජා චාරිත්‍ර නිර්මාණය වී ඇත්තේ ද ද්‍රවිඩ ආභාසය මත ය. එසේම කතරගම දෙවියන්ගේ උපත පිළිබඳ ව පවතින ද්‍රවිඩ මතවාද ද මෙම පුද බිමේ ද්‍රවිඩ සම්ප්‍රදාය හා එම ආභාසය ව්‍යාප්ත වීමට හේතු වන්නට ඇත.

කාර්තික මංගල්‍යයේ අවසන් දින පත්තිනි දේවතාවිය මුල් කර ගනිමින් පහන් මඩු ශාන්ති කර්මය සඳහා කප් සිටුවීම උග්ගල් දේවාලයේ ප්‍රදේශීය ලක්ෂණ සඳහා මනා නිදසුනකි. එනම් ඉල්මහා අවසන් කාර්තික පෙරහැර දිනයේ දී දෙසැම්බර් 31 වන දින පහන් මඩු ශාන්තිකර්මයක් සිදු කිරීම සඳහා පත්තිනි දේවාලය ඉදිරියේ කප් සිටු වීමේ චාරිත්‍රයක් සිදු කෙරේ. මෙමඟින් උග්ගල් අලුත් නුවර දේවාලයේ වාර්ෂික මංගල්‍යයන් අවසන් වන අතර නව වසරට සෙත් පැතීම ප්‍රමුඛ පරමාර්ථ අතර වේ. මෙමඟින් විද්‍යමාන වෙන්නේ සබරගමුව ප්‍රදේශීය සංස්කෘතික ලක්ෂණයන් ය. එනම් පහන් මඩුව ශාන්තිකර්මය යනුවෙන් නාමකරණය වන්නේ ලාංකේය ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයෙන් එකක් වන සබරගමවු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය යි.



1. උග්ගල් නුවර පත්තිනි දේවාලයේ කප් සිටුවීමේ චාරිත්‍රය

(කර්තෘ, ක්ෂේත්‍ර අධ්‍යයන, 2024)

ඉල්මහ කාර්තිකයේ දී ''දිග්ගේ නැටීම'' උග්ගල් අලුත් නුවර කතරගම දේවාලවට ම ආවේණික වූ චාරිත්‍රයක් වන අතර මෙම දිග්ගේ නර්තනය සබරගමුවේ බොහොමයක් දේවාල සම්ප්‍රදායට පොදු වූ අංගයකි. එනම් සබරගමුව මහ සමන් දේවාලය, සොරගුණේ දේවාලය, බොල්තුඹ දේවාලය, අම්මඩුව දේවාලය ආදි දේවාල පුද පූජා ආශ්‍රිතව දැක ගත හැකිය. නමුත් මෙවැනි චාරිත්‍ර රුහුණු මහා කතරගම දේවාලයේ ඉල්මහා කාර්තිකයේ දී දැක ගත නොහැකි වීම විශේෂත්වයකි. මාණික්‍ය මහගේ පරපුරේ කාන්තාවන් දිග්ගේ නැටීම නැමති පුද චාරිත්‍රය සිදු කරනු ලැබේ. උක්ත සඳහන් කරන ලද සියලු දේවාලයන්හි දිග්ගේ නර්තනය එක ම නෑ පරපුරේ පිරිසක් විසින් සිදු කිරීම මෙම සම්ප්‍රදායික පූජා විධිය වර්තමානය දක්වා ම පැවතීමට හේතුව වී ඇත. උග්ගල් අලුත් නුවර දේවාලයේ වර්තමානයේ ද අඩි 75 දිග 30 පළල කොටසක් දිග්ගේ නර්තනය සිදු කිරීම සඳහා වෙන් ව ඇත. මෙය මහ දේවාල දොරටුවට මුහුණලා තිබෙන අවකාශයකි. දේවාල දෛනික පූජාවේ දී මාණික්‍ය මහගේවරු දෙදනෙකු පූජාව සිදු කළ ද උත්සව අවස්ථාවන්හි දී සිව් දෙනෙකු පුද චාරිත්‍ර සඳහා සහභාගී වීම වර්තමානයේ ද සිදු වේ. පහත සඳහන් වන්නේ උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ කවිකාර මණ්ඩලය ගායනය කරන ලද දිග්ගේ නර්තනය පිළිබඳ කවියකි.

බුද්ධ හස්තය අමෘත හස්තය බ්‍රහ්ම හස්තය නංතමා
හස්ති හස්තය ලලිත හස්තය මයුර හස්තය  නංතමා
මත්ස්‍ය හස්තය ආදි සත් විද හස්ත නැටුවේ මනරමා
වීර විකුමැති නරනිඳුන් පෙර පුරුදු කළ දිග්ගෙය නැටීමා (කර්තෘ, ක්ෂේත්‍ර අධ්‍යයන, 2024)

බණ්ඩාරවරු සහ නෛයන්ඩි පංගුවේ දකුණු අත් නැටීම, නෛයන්ඩි පංගුවේ කෝලම් මුහුණු නැටීම නැමති චාරිත්‍රය උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ දැකිය හැකි එම දේවාලයට පමණක් සිදු කරන පුද චාරිත්‍රයකි. මෙවැනි චාරිත්‍ර රුහුණු මහා කතරගම දේවාලයේ දී දෘශ්‍ය නොවන අතර මෙමඟින් උග්ගල් අලුත් නුවර දේවාල චාරිත්‍ර හා බැඳී සබරගමු නර්තන සම්ප්‍රදායේ ලක්ෂණ හා සබරගමු නර්තන සම්ප්‍රදායේ අභාසය හඳුනාගත හැකිය. බණ්ඩාරවරුගේ දකුණු අත් නැටීම දැකුම් අත් නැටීම, කපු නැටීම ලෙස ද නාමකරණය වේ. මෙම චාරිත්‍රය සිදු කිරීමේ පරමාර්ථය වන්නේ කතරගම දෙවියන් හට පිං පැමිණ වීම හා කතරගම දෙවියන්ගේ ශ්‍රී විභූතිය ප්‍රකාශ කිරීමයි. මොවුන් උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ නර්තන පංගුව ලෙස රාජකාරි සිදු කරන අතර මොවුන්ගේ නර්තනයෙන් පසුව නෛයන්ඩි පංගුව තම පුද චාරිත්‍ර සිදු කරනු ලබයි. නෛයන්ඩි පංගුවේ කෝලම් මුහුණු ඉදිරිපත් කරන පිරිස කෝලක්කාර පංගුව ලෙසින් ද හඳුන්වනු ලැබේ. මෙහි දී කුමාර වෙස් මුහුණ සහ රාස්ස වෙස් මුහුණ පළඳින අතර කතරගම දෙවියන්ගේ කඩවර හෝ සූනියම් ස්වරූපය මින් නිරූපණය වන බව කෝලක්කාර පංගුවේ විශ්වාසයයි. ඒ අනුව පෝයට පුර පක්ෂය දෙවිවරු ලෙස ද අව පක්ෂය යක්ෂයන් ලෙසින් ද පෙනී සිටින බව ද මින් අනාවරණය වේ.



2. නෛයන්ඩි පංගුවේ කෝලම් මුහුණු නැටීම (රාස්ස මුහුණ)



3. නෛයන්ඩි පංගුවේ කෝලම් මුහුණු නැටීම (කුමාර මුහුණ)

(කර්තෘ, ක්ෂේත්‍ර අධ්‍යයන, 2024)

උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ සිදු වන දිග්ගේ නර්තනය ඉල්මහ කාර්තික මංගල්‍යයේ සිදුවන විශේෂ අංගයක් ලෙස සැලකිය හැකිය. මෙහි දී දිග්ගේ නර්තනය ඉදිරිපත් කරන කාන්තාවන් සුදු පැහැ රෙද්දකින් සහ සුදු පැහැ හැට්ටයකින් සැරසෙන අතර දවුල් වාදනයට අනුව හස්ත චලන කිහිපයක් සිදු කෙරේ.

**දිග්ගේ නර්තනයේ දී වාදනය කරනු ලබන දවුල් වාදන පද (3+4)**

/ජෙං - ජේ/ගත් - තත් -/ජෙං - රු/ජෙං - ගත් -/

/ජෙගු - ජේ/ගත් - තත්/ජෙං - රු/ජෙං - ගත -/

/රුං ජෙ -/ජෙග - ජෙගු -/ ජෙං - ගත්/ - - - - /

රුහුණු මහා කතරගම දේවාලයේ දී සහ උග්ගල් අලුත් නුවර කුඩා කතරගම දේවාලය යන ද්විත්වයට ම පොදු චාරිත්‍රයක් ලෙස ආලත්ති බැමේ චාරිත්‍රය හඳුනාගත හැකි ය.

ආලත්ති බැම ලෙස හඳුන්වන්නේ දෙවියන් උදෙසා සිදු කරනු ලබන රිද්මයානුකූල පහන් පිදීමක් වන අතර මෙය ආශිර්වාද ස්වරූපයකින් යුක්තය. රුහුණු මහා කතරගම දේවාලයේ ආලත්ති අම්මාවවරු දොළොස් දෙනෙකු සේවය කරන අතර උග්ගල් අලුත් නුවර සිව් දෙනෙකු සේවය කරනු ලැබේ. රුහුණු කතරගම දේවාලයේ විශේෂත්වය වන්නේ ආලත්ති පූජාව දවුල් වාදනය මූලික කරගනිමින් සිදු වීමයි. මෙම දවුල් වාදනය දේවාල ද්විත්වයට ම පොදු වුවත් දවුල් පද සහ ආලත්ති අම්මාවරු සිදු කරන ක්‍රියාවලියේ වෙනස්කම් හඳුනාගත හැකි ය.

උග්ගල් අලුත් නුවර කුඩා කතරගම දේවාලයේ දී දිග්ගේ නර්තනයෙන් පසුව ආලත්ති අම්මාවරු සිව් දෙනෙකු විසින් ආලත්ති බැමේ චාරිත්‍රය සිදු කරන අතර මෙම ආලත්ති බැම සිදු වන්නේ දවල් හා තම්මැට්ටම් වාදනය අනුව ය. මොවුන් ද සුදු පැහැ රෙද්දකින් සහ හැට්ටයකින් සැරසෙන අතර පහන් තැටි දල්වා තාලානුකූල ලෙස පහන් චලනය කිරීමක් සිදු කෙරේ. අනතුරුව කතරගම දෙවියන් නමස්කාර කිරීමෙන් පසුව බෝධි මළුව වෙත ගොස් පහන් දැල්වීම සිදු කෙරේ. මෙම දිග් ගේ නර්තනයෙහි සහ ආලත්ති බැමේ චාරිත්‍රයේ දී එම චාරිත්‍රය සිදු කරනු ලබන පාරම්පරික කාන්තාවන් සුදු පැහැති වස්ත්‍ර සඳහා ප්‍රමුඛස්ථානයක් දී තිබීම වැදගත් වේ. එමෙන් ආලත්ති බැමේ චාරිත්‍රය අවසන් වන තුරු දවුල් සහ තම්මැට්ටම් වාදනය එක ම ආකාරයකින් එනම් එක ම දවුල් පදයක් වාදනය කරනු ලැබේ. චාරිත්‍රයේ හෝ ආලත්ති අම්මාවරුන්ගේ අංග චලන අනුව දවුල් වාදන පද වෙනස් නොවේ.

/තෙරු තෙරු ජෙං ගත්/ කිට කිට ජෙං ගත්/තෙරු තෙරු ජෙං ගත්/ කිට කිට ජෙං ගත්/

/ජෙං - -/ජෙං - -/ජෙං - -/ (හමාර කිරීමේ පදය)

රුහුණු මහා කතරගම දේවාලයේ ආලත්ති පූජාවේ වාදනය කරනු ලබන දවුල් පද උග්ගල් අලුත් නුවර ආලත්ති පූජාවේ දී වාදනය කරනු ලබන දවුල් පදවලට සාපේක්ෂ ව වෙනස් වේ.

**රුහුණු මහා කතරගම දේවාලයේ ආලත්ති අම්මාවරු ආලත්ති පූජාව සඳහා පහන් ගැනීමේ දවුල් වාදනය (4+4)**

/ගත් තෙරු ජෙං කු/ කු ද ග ත/ /ගත් තෙරු ජෙං කු/ කු ද ග ත/

**ආලත්ති බැමේ දවුල් වාදනය (3+3)**

/ජෙං තෙරු ජෙං/ජෙං තෙරු ජෙං/ජෙං තෙරු ජෙං/තෙරු ජෙං +/

/ජෙං + + /

/ජෙං තෙරු ජෙං/ජෙං තෙරු ජෙං/ජෙං තෙරු ජෙං/තෙරු ජෙං +/

/ජෙං + + /

**(4+4)**

/ජෙං තෙරු ජෙං කු/කු ද ග ත/ජෙං තෙරු ජෙං කු/කු ද ග ත/

/තෙරු තෙරු ජෙං ගත්/ තෙරු තෙරු ජෙං ගත්/ } ////

/තෙරු තෙරු ජෙං ගත්/තෙරු තෙරු ජෙං ගත්/

**(3+3)**

/තෙරු තෙරු ජෙං/

/තෙරු තෙරු ජෙං/ ////

/තෙරු තෙරු ජෙං/

**(4+4)**

/තෙරු තෙරු ජෙං ගත්/ ////

/තෙරු තෙරු ජෙං ගත්/

/තෙරු තෙරු ජෙං/////////////////////////////////

/තෙරු ජෙං තෙරු ජෙං////

**(4+4)**

/කු කු ද ග/ත තෙරු ජෙං -/ ////

/කු කු ද ග/ත තෙරු ජෙං -/

(කර්තෘ, ක්ෂේත්‍ර අධ්‍යයන, 2024)

මෙහි දී පහත් තැටි අංග චලනය කිරීම, පූජාව සිදු කරන ක්‍රියා පිළිවෙළ හා පූජාව සඳහා ගත වන කාලය එකිනෙකට විෂම වේ. එසේම උග්ගල් නුවර දේවාලයේ දී ආලත්ති අම්මාවරුන්ගේ ඇඳුම් පැළඳුම් ආලත්ති පූජාවේ පවතින බෞද්ධාගමික මුහුණුවර නිරූපණය වේ. එනම් රුහුණු මහා කතරගම දේවාලයේ ආලත්ති අම්මාවරුන්ගේ ඇඳුම් වල්ලි අම්මා දේවතාවියගේ ඇඳුමට සමාන වන අතර ඔවුන්ගේ සම්භවය වැදි පරපුර නියෝජනය වන නිසාවෙන් එය සිහි ගන්වමින් කතරගම දෙවිඳුන්ට ආසිරි පතා මෙම පූජාව සිදු කරන බව එම ප්‍රජාවගේ විශ්වාසයයි. නමුත් උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ ආලත්ති අම්මාවරුන්ගේ ඇඳුම තනි සුදු පැහැය වන අතරම සබරගමුවේ මාණික්‍ය මහගේ පරම්පරාව වර්තමානයේ පවා නියෝජනය කරන අතර ම දේශීය බෞද්ධ මුහුණුවර එමඟින් ප්‍රබල ලෙස ජන සමාජයට සංකේතාත්මකව ඉදිරිපත් කෙරේ.



4. උග්ගල් අලුත් නුවර කතරගම දේවාලය ආලත්ති බැම



5. රුහුණු මහා කතරගම දේවාලය ආලත්ති බැම

(කර්තෘ, ක්ෂේත්‍ර අධ්‍යයන, 2024)

## 4. සමාලෝචනය

අතීතයේ සිට වර්තමානය දක්වා ම කතරගම දේව වන්දනය ලාංකේය සමාජයෙහි වඩාත් ප්‍රචලිත ආගමික සංකල්පයකි. බෞද්ධ ජනයා විසින් ද කතරගම දෙවි පුද ලබන අතර බෞද්ධ විහාරස්ථාන අභ්‍යන්තරයෙහි මෙන් ම ඉන් පිටත ද කතරගම දේවාලය තනා ගැනීමෙන් සිංහල බෞද්ධයෝ කතරගම දෙවි පුදති.

ලංකාවේ විවිධ ප්‍රදේශ ආශ්‍රිතව කතරගම දේවාල පවතින අතර එහි දී කතරගම දෙවියන් විෂයෙහි සිදු කරන පුද සිරිත් පුරාණ චාරිත්‍ර පිළිබඳ අධ්‍යයනයේ දී උග්ගල් අලුත් නුවර කතරගම දේවාලය සඳහා ද සුවිශේෂ ස්ථානයක් හිමි වේ. කතරගම දෙවියන් උදෙසා රුහුණු මහා කතරගම දේවාලයෙහි සිදු කරනු ලබන සියලු පුද උත්සව මංගල්‍යය උග්ගල් අලුත් නුවර කතරගම දෙවොලෙහි සිදු වුව ද මේවායෙහි ප්‍රදේශීය වශයෙන් ප්‍රකට වන සංස්කෘතික ලක්ෂණ මත පදනම් වූ විෂමතා දැකිය හැකිය. කතරගම දෙවියන් උදෙසා වාර්ෂික උත්සව අතර කාර්තික මංගල්‍යයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. එනම් උත්කර්ෂවත් ලෙස වීදි සංචාරක කරමින් පෙරහැර මංගල්‍යයක් රුහුණු මහා කතරගම දේවාලයේ සිදු වුව ද, උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ සිදු වන්නේ චාරිත්‍ර පමණක් සිදු වන මළුවේ පෙරහැරක් පමණි. මෙය දින පහක් පුරා සිදුවන අතර රුහුණු මහා කතරගම දේවාලයේ කාර්තික පෙරහැර සිදු වන්නේ එක් දිනක් පමණි. වීදි සංචාරය කරන පෙරහැරක් සහිත කතරගම ඉල් පෙරහැර ඊට ම අනන්‍ය වූ ලක්ෂණවලින් සමන්විත වීම කතරගම කාර්තික මංගල්‍යය සංස්කෘතික වශයෙන් වැදගත් වීමට හේතු වන අතර ම බහු සංස්කෘතික ලක්ෂණ අන්තර්ගත වීම ද විශේෂත්වයකි. කතරගම දෙවියන් වෙනුවෙන් වර්ෂයකට පෙරහැර මංගල්‍යය ත්‍රිත්වයක් සිදු කරන අතර වර්ෂ අවසාන පෙරහැර මංගල්‍යය වන්නේ ඉල්මහ කාර්තික උත්සවය යි. විශේෂයෙන් අතීතයේ සිට පැවත එන පාරම්පරික චාරිත්‍ර බැඳී පවතියි. වත බැඳීම, දෙවියන් වැඩම වීම, පොරොන්දු පඩි ලබා දී ඊළඟ වසරට රාජකාරි මණ්ඩපය නිලධාරීන් පත් වීමෙන් පසුව ඔවුන් සිදු කරන පළමු මංගල්‍යය වීම, කතරගම දේවාලයට අයත් දිරාපත් ද්‍රව්‍ය දිය මුදුන් තොටින් පා කිරීම වැනි වැදගත් පූර්ව චාරිත්‍ර රැසක් රුහුණු මහා කතරගම දෙවොලෙ දී සිදු වේ. නමුත් එවැනි චාරිත්‍ර උග්ගල් අලුත් නුවර දී අනාවරණය කරගත නොහැකි විය. මෙම දේවාල ද්විත්වයෙහි ම කාර්තික මංගල්‍යයේ දී සියලු පුද පූජා කපුමහතුන් විසින් මාසික බෙදීමක් යටතේ ආවේණික සිරිත් හා පාරම්පරිකව නීති රීති යටතේ ද සිදු කරන බව ද අනාවණය විය. එහි දී නැකැත් චාරිත්‍ර මූලික වේ. විශේෂයෙන් අවසන් දින පෙරහැර සිදු වන්නේ නැකැත් චාරිත්‍ර මූලික කර ගනිමිනි. එහි දී රුහුණු මහා කතරගම දේවාල කාර්තික මංගල්‍යය අවසන් පෙරහැර පෝය දින හෝ ඊට පසු දින හෝ පෙර දින සිදු වන අතර පෙරහැර පැවැත්වෙන දිනය තීරණය වන්නේ නැකැත් මූලික වෙමිනි. නමුත් උග්ගල් අලුත් නුවර කතරගම දේවාල අවසන් පෙරහැර පෝය දින ම සිදු වීම විශේෂත්වයකි. පෙරහැර ගෙවැදීමෙන් පසුව ආලත්ති බැමේ චාරිත්‍ර සිදුවන අතර මෙම චාරිත්‍රය සිදු වන්නේ දේවාල ද්විත්වයට ආවේණික වූ පාරම්පරික ක්‍රමවේදයකට ය. රුහුණු මහා කතරගම දේවාලයේ ආලත්ති බැමේ චාරිත්‍රය සඳහා මෙන් ම ආලත්ති අම්මාවරු සඳහා ලැබී ඇත්තතේ ප්‍රමුඛ ස්ථානයකි. එනම් කතරගම දෙවියන්ගේ එක් භාර්යාවක් වන වල්ලි අම්මා පරපුර සිහිකරමින් මොවුන් චාරිත්‍ර ඉටු කරන අතර උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ දී එවැනි වල්ලි අම්මා පරපුර නියෝජනය කිරීමක් දැක ගත නොහැකි ය.

වල්ලි අම්මා දේවාලය සහ තේවානි අම්මා දේවාලය හා බැඳුණු වත් පිළිවෙත් රුහුණු මහා කතරගම දේවාලයේ කාර්තික මංගල්‍යය වඩාත් විශේෂ කිරීමට හේතු වෙයි. වල්ලි අම්මා දෙවොලයෙහි චාරිත්‍ර දේශීය වාදන සම්ප්‍රදාය මධ්‍යයේ පුද පූජා සිදුවන අතර හා තේවානි අම්මා දෙවොලෙහි චාරිත්‍ර ඉන්දියානු වාදන මධ්‍යයේ ඉන්දියානු සම්ප්‍රදාය අනුව පුද පූජා සිදු වේ. උග්ගල් අලුත් නුවර දී වෙනත් කිසිදු දේවාලයක් සම්බන්ධ වීමෙන් පුද චාරිත්‍ර කාර්තික මංගල්‍යයේ දී සිදු නොවන අතර පත්තිනි දේවාලය මූලික වෙමින් කප් සිටු වීමක් පමණක් සිදු කරනු ලැබේ. කප් සිටුවීමෙන් පසුව සිදු කරන පහන් මඩු ශාන්ති කර්මය උග්ගල් අලුත් නුවර දේවාලයේ සිදු කරන අවසාන පුද චාරිත්‍රය යි. කතරගම දෙවියන් උදෙසා ''දිග්ගේ නැටීම'' නැමති නර්තනය කාර්තික මංගල්‍යයක් අරමුණු කොටගෙන උග්ගල් අලුත් නුවර දී සිදු වන නමුත් රුහුණු මහා කතරගම දේවාලයේ මෙවැනි වූ නර්තනයක් හෝ චාරිත්‍රයක් සිදු නොවන බවත් පුද චාරිත්‍ර පිළිබඳ අධ්‍යයනයේ දී අනාවරණය වූ සුවිශේෂ කරුණකි. ඒ දිග්ගෙයි නර්තනය රුහුණු ප්‍රදේශයට ආවේණික වන්නක් නොව සබරගමු පළාතට ආවේණික වූවක් වන හෙයිනි. උග්ගල් දේවාල චාරිත්‍ර අධයායනයේ දී අනාවරණය වූ විශේෂිත කරුණක් වන්නේ මෙහි පුද පූජා චාරිත්‍ර බෞද්ධාගමික මුහුණුවරක් ගන්නා බවත් සබරගමු ප්‍රදේශීය ලක්ෂණ හා සංස්කෘතිය ඒවායින් මැනවින් නිරූපණය වන බවත් ය. පත්තිනි දේවාලය මූලික වෙමින් චාරිත්‍ර සිදු කිරීම, පහන් මඩුවපැවැත්වීම, පුද පූජාවල දී සබරගමු නර්තන ලක්ෂණ සහිත චාරිත්‍ර දැක ගත හැකි වීම, මළුවේ බෝධිය අසල පහන් දැල් වීම ආදිය උක්ත කාරණයට මනා නිදසුන් ය.

රුහුණු මහා කතරගම කාර්තික මංගල්‍යයේ පෙරහැර චාරිත්‍ර වාරිත්‍ර මෙන් ම ඒ හා බැඳුණු වල්ලි හා තේවානි අම්මා දේවාල පුද පූජා චාරිත්‍රවලින් ඊට ම අනන්‍ය වූ සුවිශේෂ ලක්ෂණ මෙන් ම ආගමික සහජීවනයක් ද කතරගම කාර්තික මංගල්‍යයෙන් ප්‍රකට වේ. උග්ගල් අලුත් නුවර දී සිදුවන සියලු චාරිත්‍ර හා පුද පූජා සිංහල සාම්ප්‍රදායික සිරිත් හා සමාන වන බවත්, ද්‍රවිඩ සම්භවයක් දෘෂ්‍ය නොවන බව ද අනාවරණය වූ වැදගත් කරුණකි. එසේම නිල් පන්දම රැගෙන ඒම, බණ්ඩාරවරුන් හා නෛයියන්ඩි පංගුව දකුණු අත නැටීම, නෛයියන්ඩි පංගුවේ කෝලම් මුහුණු නැටීම ආදි රුහුණු මහා කතරගම දේවාලයේ සිදු නොවන චාරිත්‍ර රැසක් උග්ගල් අලුත් නුවර කුඩා කතරගම දෙවොලයෙන් අනාවරණය විය. කතරගම දෙවියන් අරමුණු කොට ගනිමින් මෙම දේවාල ද්වයෙහි ම කාර්තික මංගල්‍යය පවත්වන්නේ වුව ද එම දේවාල ද්විත්වය සඳහා පමණක් සීමා වූ, ප්‍රදේශීය වශයෙන් සංස්කෘතික තත්ත්වයන් ප්‍රකට කරන පූජා හා චාරිත්‍ර සම්ප්‍රදායක් පවතින බව උක්ත අධ්‍යයනයෙන් පැහැදිලි විය.

## පරිශීලිත මූලාශ්‍රය


ආටිගල, අසංක. (2015). ***පෙරහර විත්ති.*** වරකාපොළ: හෙළදිව ප්‍රකාශකයෝ.

ඕවිටිගෙදර, සුනිලා. (2001). ***අලුත් නුවර දේවාලය සහ වත්පිළිවෙත් විමර්ශනය.*** මොරටුව: තරංජි ප්‍රින්ටර්ස්.

ඥානවිමල හිමි, කිරිඇල්ලේ. (1946). ***සබරගමුවේ පැරණි ලියවිලි***. ලෝකෝ යන්ත්‍රාලය.

දේවප්‍රිය, සන්දිම. (2021). **1907** ***ඇසළ උත්සවය පිළිබඳ සටහන් ලිපිය. සුරිඳුනි කතරගම.*** ඇම්. ජී. එච්. ප්‍රින්ටින්. 53-57 පිටු.

දේවප්‍රිය, කේ. ඩී., (2015). ***දුටු නොදුටු කතරගම දෙවිඳු***. කොළඹ 10: සූරිය ප්‍රකාශකයෝ.

ප්‍රනාන්දු, ඩබ්. ලයනල්. (2005). ***කතරගම සහ එහි උත්සව.*** (1819-1839). කොළඹ 10: සූරිය ප්‍රකාශකයෝ.

බණ්ඩා, සුමනසේකර. ස.ජ., (1993). ***කඳ කුමර සිරිත.*** පාදුක්ක: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

මද්දුමාගේ, ආචාර්ය ගයානි දීපිකා. (2019). ***බලන්ගොඩ දේවාල සංස්කෘතිය.*** කොළඹ 10: සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

රණසිංහ, සුමිත්. (2011). ***කතරගම් පුවත.*** බත්තරමුල්ල: මධ්‍යම සංස්කෘතික අරමුදල.

රත්නපාල, නන්දසේන. (1995). ***ජනශ්‍රැති විද්‍යාව.*** සුභද්‍රා මුද්‍රණාලය.

වික්‍රමගමගේ, චන්ද්‍ර. (1997). ***කතරගම හා කතරගම දෙවිඳු.*** සීමාසහිත දීපානි මුද්‍රණ/ප්‍රකාශන.

සිල්වා, එච්. ජයසේන ද., (2023). ***රුහුණු කතරගම දෙවියෝ.*** කොළඹ 10: සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

සෝරත හිමි, අලුත් වැව. (2009). ***කතරගම පුද සිරිත්.*** නුගේගොඩ. සී/ස සරසවි ප්‍රකාශකයෝ.

Weerasooriya, R.M.P.S., Ranaweera, W.V.P.H., (2025). ***An investigative study of the rituals and offerings of the Ilmaha Mangalyaya at the Ruhunu Kataragama Dewalaya,*** Vidyodaya Journal of Humanities and Social Sciences (VJHSS)., Vol. 10 (02). University of Sri Jayewardenepura. 182-194 pp.